**ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------------**

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි **13** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී නොවන බව

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු 2019 වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් ශේෂය, භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂයේ එම වත්කම්වල ආරම්භක ශේෂය සමග එකඟ කිරීමේදී රු. 1,672,745ක නොසැසඳුණු වෙනසක් පැවතිණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් සිදුකරනු ලැබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ ආරම්භක ශේෂවල එකතුව, ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වත්කම් ශේෂය හා නොසැසඳුණි. මේ හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම රු. 8,375,267ක් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් මෙම වරද සිදු වී තිබුණි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ශේෂය ලෙස දක්වා තිබුණු වටිනාකමට වඩා රු. 3,945,967ක් වැඩියෙන් එදිනට, එම වත්කම් වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |

### 1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවීම් තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි රහිතව පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් වවුචර් 20ක් සඳහා රු.3,294,792ක් ගෙවා තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ලියවිලි අදාළ ගොනුවල තිබුණු නිසා ගෙවීම් වවුචර් සමහ ඉදිරිපත් කර නොතිබුණි. වර්තමානයේ ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගෙවීම් වෙනුවෙන් විගණන සාක්ෂි ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ අග්‍රිම රු.1,226,284,861ක් නොලද බැවින් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමටත්, සැලසුම් කළ ව්‍යාපෘති නිම කිරීමටත් නොහැකි වී තිබුණි. | භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබී නොතිබුණි. එහෙත්, අදාළ ගෙවීම් අතැති බිල්පත් වශයෙන් දක්වා වර්තමානයේ ගෙවීම් සිදුකර ඇත. | වැඩි අවශ්‍යතාවක් පවතින කාර්යයන් සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූලධන වැය විෂයන් 04ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 1,709,145ක් එනම්, මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27ක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මිල ගණන් කැඳවා සැලැසුම් කිරීමේ දුෂ්කරතාවන් පැවැතිණි. | සැලසුම් කළ කාර්යයන් ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට අවශ්‍ය පිළියම් යෙදීම. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 09ක මූලික ප්‍රතිපාදනයෙන් සියයට 01ත් 43ත් අතර පරාසයකින් ඉතිරිවීම් පැවැති අතර තවත් වැය විෂයයන් 07ක මූලික ප්‍රතිපාදනයෙන් සියයට 01ත් 26ත් අතර පරාසයකින් අතිරික්තයන් පැවැතුණි. එමෙන්ම, මුළුමනින්ම ප්‍රතිපාදන ඉතිරි වූ වැය විෂයක් ද පැවැතිණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අතිරේක වියදම් වැඩි වී තිබුණි. | ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල කළ යුතු වීම. |

## 2.3 රජයේ නිලධාරීන් සඳහා වූ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව සේවයෙන් ඉවත්ව ගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් අයකර ගතයුතු වර්ෂ 10කට වඩා පැරණි රු.820,425ක ශේෂයක් අයකර ගැනීමට මේ දක්වා පියවර ගෙන නොතිබුණි. | නිලධාරීන්ගේ හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | හිඟ ශේෂ නියමිත කාලයේදි අය කර ගැනීමට පියවර ගැනීම. |

## 2.4 තැන්පත් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වර්ෂ 02කට වඩා පැරණි එකතුව රු.5,424,688ක තැන්පතු 36ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කිරිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පියවර ගෙන නොතිබුණි. | ගෙවීම් සිදුකර සහ ගෙවීම් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් ලද රු.3,274,966 ක් අදාළ අරමුණු සඳහා භාවිතා නොකර පසුගිය වර්ෂ 01ත් 03ත් අතර කාලයක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | සමහර තැන්පත් නිදහස් කිරීමටත්, තවත් තැන්පතු ආදායමට බැර කිරීමටත් ඉතිරි තැන්පතුවලින් ව්‍යාපෘති ආරම්භ කිරීමටත් කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 බැරකම් සහ බැඳීම්වලට එළැඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අංක 05/2020 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශවල 4.11 ඡේදයට පටහැනිව, රු. 874,403ක පුනරාවර්තන වියදම් සහ රු.2,818,046ක මූලධන වියදම් 2021 වර්ෂයේදි නිරවුල් කර තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් සමග සම්බන්ධ වී වැඩ කළ නොහැකි වූ නිසා මෙවැනි තත්ත්වයක් ඇති වී තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව බැඳීම් සහ බැරකම් හෙළිදරව් කළ යුතුවේ. |
| (ආ) අග්‍රිම නොලැබීම නිසා, ඉටු කළ මූලධන කාර්යයන් සඳහා ගෙවීම් සිදුකළ නොහැකි වීමෙන් රු. 100,823,363ක් බැරකම් සඳහා බැඳී තිබුණි. | අග්‍රිම නොලැබීම හේතුවෙන් බැඳීම් ලෙස ඉදිරිපත් කර තිබූ ව්‍යාපෘති සඳහා වූ ගෙවීම් සිදු කරන ලදී. | අප්‍රමාදව බැරකම් පියවීමට කටයුතු කිරීම. |

**2.6 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 54ක් විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දුන් ප්‍රතිපාදනවලින් රු. මිලියන 95ක් හෙවත් සියයට 7ක් සමාලෝචිත වර්ෂයේදි ඉතිරි වී තිබුණි. | පුහුණු පාඨමාලා සහ සමාජීය වැඩසටහන් වෙනුවෙන් මෙම ප්‍රතිපාදන බොහෝමයක් ලැබී තිබුණ ද, කොවිඩ් 19 හේතුවෙන් ඒවා පැවැත්වීමට නොහැකි විය. | වැඩි අවශ්‍යතාවක් පවතින කාර්යයන් සඳහා ප්‍රමුඛතාව ලබා දීම. |

**2.7 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වටිනාකම රු.36,773,749ක් වූ විගණන විමසුම් 09කට පිළිතුරු ලබා දී නොතිබුණි. | නිලධාරීන්ට අදාළ උපදෙස් ලබා දී ඇත. ඉදිරියේදි නියමිත කාලය තුළ පිළිතුරු ලබා දීම සහතික කරනු ලැබේ. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.8** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| | (i) මුදල් රෙගුලාසි 260(i) සහ 389(අ) | 546,684 | පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් කිරීමේදී ආදායකයාට චෙක්පත ලබා දීම වෙනුවට විෂය භාර නිලධාරි විසින් චෙක්පත් ලබාගත් අවස්ථා පැවතුණි. | වර්තමානයේදී එවැනි චෙක්පත් බැංකුවේ තැන්පත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2) | 340,550 | නියමිත කාර්යය නිම කර තිබුණද, ලබා දුන් අතුරු අග්‍රිම කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | Covid -19 වසංගත තත්ත්වය නිසා නියමිත කාලය තුළ නිරවුල් කළ නොහැකි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 754 | - | වාර්ෂිකව ඉන්වෙන්ට්‍රි ලේඛනය තුලනය කිරීමේ පිළිවෙතක් නොතිබුණි. | ඉදිරි කාලයේදී නිසි පරිදි තුලනය කිරීමට විෂයභාර නිලධාරීට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වාහන 09ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවක් කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවක් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛ

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | 2017 ජුලි 04 දිනැති අංක 2017/01 දරන චක්‍රලේඛය | - | රජය විසින් ප්‍රදානය කළ දේපළ භාවිතා කර ව්‍යාපාරික ආයතන 169ක් වර්ෂ 08ත් 10ත් අතර කාලයක සිට පවත්වාගෙන යන නමුත් එම දේපළලාභීන් සමග ගිවිසුම්වලට එළැඹ බදුකුලී අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | පිඹුරුපත් සැකසීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව ට දන්වා ඇත. ඒ අනුව ඉදිරි පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරන චක්‍රලේඛයේ 5 (iii) සහ 6(ඇ) ඡේද | 7,875,400 | බදු දුන් ඉඩම්වලින් 2014 සිට 2020 වර්ෂ දක්වා රු. 7,875,400ක හිඟ බදුකුලී අයකර නොතිබුණි. | අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟකුලී සහ බදුකුලී අයකර ගත යුතුවේ. |

**2.9 අවිධිමත් ගනුදෙනු**

**සහතික නොකළ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,972,810 ක ගෙවීම් වවුචර් මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව සහතික කර නොතිබුණි. | පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවීම් වවුචර් වර්තමානයේ සහතික කර ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබුණු පිළිතුරු අපැහැදිලි විය. | මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව, සියළුම ගෙවීම් සහතික කළ යුතුය. |

**2.10 බැංකු ගිණුම් පවත්වාගෙනයාම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් භාණ්ඩ ලබා ගැනීමට පෙර රු. 2,765,485ක චෙක්පත් 18ක් ලියා කාර්යාලයේ රඳවා ගෙන තිබීම මුදල් රෙගුලාසි 137 හා 138 ට පටහැනි විය. | සියළුම චෙක්පත් නියමිත පුද්ගලයින්ට ලබා දී ඒවා මාරු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැසුමක් සකස් කර නොතිබුණි. | ප්‍රතිපාදන කොටස් හතරකින් නිදහස් කළ බැවින් හා කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලැසුම් සකස් නොකරන ලදි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2020 දෙසැම්බර් මාසයේදී නිම කළ යුතු රු. මිලියන 5.1ක් වටිනා ව්‍යාපෘති 03ක් මෙන්ම, අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලින් රු.394,803ක් පිරිවැය වූ ව්‍යාපෘති 2021 ජූනි මාසය දක්වාම අවසන් කර නොතිබුණි. | කාර්යයන් අවසන් කර ගෙවීම් සිදුකිරීමට කටයුතු කර ඇත. | සියළුම ව්‍යාපෘති ගිවිසුම් කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ අංක 14 දරන මාර්ගෝපදේශය පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අත්සන් කර තිබූ නමුත් කොවිඩ් 19 හේතුවෙන් නියමිත දිනයේදි ඉදිරිපත් කළ නොහැකි විය. නමුත්, අමතර පිටපත 2021 පෙබරවාරි 24 දින විගණන උපකාර්යාලයට ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**3.4 ව්‍යාපෘති වත්කම් ඌන උපයෝජනය/නිෂ්කාර්යව පැවැතීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විවිධ සේවා සමුපකාර සමිතිවලට ලබාදුන් රු.28,756,571ක් වූ ගොඩනැගිලි සහ උපකරණ වර්ෂ 02කට වැඩි කාලයක් අභාවිතව පැවැතුණි. | භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. තෙල් නිෂ්පාදන කටයුතු සිදුවෙමින් පවතී. පෞද්ගලික පාර්ශවයක් සමග එක්ව වී මෝල ක්‍රියාත්මක කර නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී. | අදාළ වත්කම් භාවිතා කිරීමට සුදුසු පියවර ගත යුතුවේ. |

**3.5 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සහ 2019 මාර්තු 23 දිනැති අංක 07/2019 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, පච්චිලෙයිප්පල්ලි සහ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 04දෙනෙකුගෙන් ඇප මුදල් අයකර නොතිබුණි. | අයකිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**3.6 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂය තුළ දී ව්‍යාපාරික ස්ථාන 03කින් සිදුකළ රු. 2,671,969ක ප්‍රශ්නගත | එම විමර්ශන වාර්තාව අප | විමර්ශන කටයුතු අවසන් කර සුදුසු |

| | | |
|---|---|---|
| මිල දී ගැනීම් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීමට 2020 සැප්තැම්බර් මාසයේ පත්කළ විමර්ශන කමිටුවේ වාර්තාව මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වෙත ලැබී නොතිබුණි. | ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.7 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගැයීම් කමිටු නිලධාරීන්ට සිදු කර තිබුණු රු. 13,500ක වැඩිපුර ගෙවීම් ආපසු අයකර නොතිබුණි. | **Covid** -19 වසංගත තත්ත්වය හේතුවෙන් තීරණ ගැනීමේදී කාල ප්‍රමාදයන් සිදුවී තිබුණි. | වැඩිපුර ගෙවීම් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ආ) පාසැලක් වටා ඉදි කළ තාප්පයක් වෙනුවෙන් රු.142,988ක් වැඩියෙන් ගෙවා තිබුණි. | ආපසු අයකිරීමට කටයුතු කරමින් පවතී. | වැඩිපුර ගෙවීම් ආපසු අය කළ යුතුවේ. |

**4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිළිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු හා ඒ අනුව සකස් කළ ඉලක්ක 2021 අප්‍රේල් 30 දින වන විටත් සකස් කර නොතිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා නොගන්නා ලදි. වර්තමානයේ සැලැසුම් සකස් කර ඇත. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ඉටු කරගත යුතුය. |

**5. යහපාලනය**

**5.1 මහජනයාට සේවාවන් ඉටු කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.3,960,000ක් වැයකර 2020 වර්ෂයේදි ඉදිකළ | මෙම මාර්ග ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ | මාර්ග විධිමත්ව |

| | | |
|---|---|---|
| බොරලු මාර්ග 03ක් කෙටි කලක දී එනම්, 2021 මාර්තු මාසය වන විට දැඩි ලෙස අබලන්ව මහජනතාව දුෂ්කරතාවන්ට පත්කර තිබුණද, ඒ වෙනුවෙන් සාධනීය පියවරක් ගෙන නොතිබුණි. | ක්‍රියාත්මක වූ බැවින් ප්‍රාදේශීය සභාවෙන් වාර්තාවක් කැඳවා ඇත. | ඉදිකළ යුතුවේ. |

**6. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට පටහැනිව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 74 දෙනෙකු වර්ෂ 06 සිට 23 ක් දක්වා එකම සේවා ස්ථානයක සේවයේ නිරතව සිටී. | වරෂ 05කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයැදුම් කර ඇත. අයැදුම් නොකළ නිලධාරීන්ට ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් ලබා දේ. | චක්‍රලේඛය ප්‍රකාරව පියවර ගත යුතුය. |
| (ආ) | පුරප්පාඩු 51ක් අවශ්‍යතාව මත සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සම්මේලනයේදී මේ සඳහා තීරණයක් ගැනීමට අපේක්ෂා කෙරේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |